# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2002/34 - 2017 ජනවාරි මස 18 වැනි බදාදා - 2017.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xiv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20(4) (ආ) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4) (ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, ශ්‍රී ලංකාවේ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ පරිපාලන කටයුතු බරපතල ලෙස අවුල් වී ඇති බවට සහ එම විද්‍යායතනයේ බලධාරීන් විසින් එම විද්‍යායතනයේ කටයුතු යථා තත්ත්වයට ගෙන ඒමට අපොහොසත් වී ඇති බවට ද සෑහීමට පත් වීමෙන් පසු, එකී පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ ශ්‍රී ලංකාවේ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙත පිරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද පිළිවෙලින් යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ හෝ කිරීමේ කාර්යය සඳහා එකී ශ්‍රී ලංකාවේ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය ජයන්ත වැලිහිඳ, 2016 නොවැම්බර් 26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මේ නියමය මගින් පත් කරමි.

ලක්ෂ්මන් කිරිඇල්ල,<br>
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 31 වැනි දින,<br>
කොළඹ දී ය.

02 - 101

1A - PG 3347 — 508 (2017/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*